# ශ්‍රී ලංකා නීතිඥ සංගමය
# இலங்கை சட்டத்தரணிகள் சங்கம்
# BAR ASSOCIATION OF SRI LANKA

**<u>සිංහල පරිවර්තනය</u>**

2026 සැප්තැම්බර් 23

**<u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිදෙවන සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ප්‍රකාශය</u>**

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිදෙවන සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් සිය තීරණය මේ වන විට ප්‍රකාශයට පත් කර ඇති අතර, එම පනත් කෙටුම්පත සම්මත කිරීම සඳහා ජනමත විචාරණයකදී ජනතාවගේ අනුමැතිය ලබාගැනීම අවශ්‍ය නොවන බව තීරණය කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 120, 121 සහ 123 වගන්ති අනුව, පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පැවරී ඇති අධිකරණ බලය වන්නේ එය සම්මත කර ගැනීම සඳහා අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අවශ්‍යතා නිශ්චය කිරීමයි. එහිදී විශේෂයෙන්ම, 83 වන වගන්තිය අනුව එම පනත් කෙටුම්පත හෝ එහි කිසියම් විධිවිධානයක් සඳහා ජනමත විචාරණයකදී ජනතාවගේ අනුමැතිය අවශ්‍ය වන්නේද යන්න තීරණය කිරීම ඊට ඇතුළත් වේ.

එබැවින්, මෙම තීරණය යෝජිත සංශෝධනය සාධනීය හෝ අසාධනීයද, උචිත හෝ අනුචිතද, බුද්ධිමත් හෝ අනුවණ ක්‍රියාමාර්ගයක්ද, නැතහොත් පාර්ලිමේන්තුව විසින් එය සම්මත කළ යුතුද යන්න පිළිබඳව තීරණයක් නොවේ.

ශ්‍රී ලංකාවේ පෙර පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සම්බන්ධයෙන්ද මෙම වෙනස පැහැදිලිව දැකගත හැකිය. දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වසර 48ක ඉතිහාසය තුළ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල අවශ්‍යතා සපුරාලන බවට තීරණය වූ නමුත්, ප්‍රජාතන්ත්‍රවාදය, ව්‍යවස්ථානුකූලත්වය, අධිකරණයේ ස්වාධීනත්වය සහ නීතියේ ආධිපත්‍යය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කළ සංශෝධන රැසක් පැවතී ඇත.

එබැවින් දැන් මතුවන ප්‍රශ්නය වන්නේ යෝජිත සංශෝධනය පාර්ලිමේන්තුව විසින් සම්මත කළ යුතුද යන්නයි. එම වගකීම පාර්ලිමේන්තුවටත්, පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඡන්දය ප්‍රකාශ කරන සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුටමත් පැවරේ.

එම තීරණය ගැනීමේදී, විසිදෙවන සංශෝධනය අප රට කෙරෙහි ඇති කළ හැකි සහ ඇති කිරීමට ඉඩ ඇති ප්‍රතිවිපාක පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නිසි අවධානය යොමු කළ යුතුය. එමෙන්ම, විසිදෙවන සංශෝධනය හඳුන්වාදීමේදී පැවති විනිවිදභාවයේ සහ විධිමත් උපදේශන ක්‍රියාවලියක අඩුවද ඔවුන් සැලකිල්ලට ගත යුතුය. ජනතාවගේ නියෝජිතයන් වශයෙන්, යෝජිත සංශෝධනය සම්බන්ධයෙන් සමාජයේ පුළුල් පරාසයකින් ඉදිරිපත් වී ඇති කරුණු හා අවධානය යොමු කිරීම්ද ඔවුන් සලකා බැලිය යුතුය. ඒ අතරට ත්‍රෛනිකායික මහානායක හිමිවරුන්, ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය, ලංකා සභාව, ශ්‍රී ලංකා නීතිඥ සංගමය, අධිකරණ සේවා සංගමය, පොදු රාජ්‍ය මණ්ඩලීය නීතිඥ සංවිධානය, LAWASIA සංවිධානය, ජාත්‍යන්තර විනිසුරුවන්ගේ සංවිධානය, විනිසුරුවරුන්ගේ සහ නීතිඥවරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු, ප්‍රංශ ජාතික නීතිඥ සභාව සහ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ඇතුළු ප්‍රමුඛ වෘත්තීය ආයතන මෙන්ම වෘත්තීය සංගම් සහ වෘත්තීය සමිති 40කට අධික සංඛ්‍යාවක් විසින් පළ කර ඇති කරුණු ඇතුළත් වේ.



President Rajeev Amarasuriya | Deputy President Rienzie Arsecularatne PC | Secretary Nalin De Silva | Treasurer Pasindu Silva | Assistant Secretary Lakitha Wakishta Arachchi

No. 153, Mihindu Mawatha, Colombo 12, Sri Lanka.
Telephone : +94 11 2447134, +94 11 2331697, Fax : +94 11 2331697 E-mail : info@basl.lk Web : www.basl.lk

ඒ අනුව, විසි දෙවන සංශෝධනය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ සියලු දේශපාලන පක්ෂවලින් ශ්‍රී ලංකා නීතිඥ සංගමය ඉල්ලා සිටින්නේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තම හෘදය සාක්ෂියට අනුව විසිදෙවන සංශෝධනය සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමටත් ඡන්දය ප්‍රකාශ කිරීමටත් අවස්ථාව සලසා දෙන ලෙසයි.

ඡන්දය ප්‍රකාශ කිරීමට කැඳවනු ලබන අවස්ථාවේදී, තම ව්‍යවස්ථාමය වගකීම, ජනතාවගේ නියෝජිතයන් වශයෙන් තමන්ට පැවරී ඇති වගකීම සහ, වඩාත්ම වැදගත් ලෙස, ශ්‍රී ලංකාවේ ස්වෛරී ජනතාව වෙත තමන්ට පැවරී ඇති යුතුකම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමින්, තම හෘදය සාක්ෂියට අනුව ප්‍රතිපත්තිගරුක ස්ථාවරයක් ගැනීමේ වගකීම දැන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත පැවරී ඇත.

*අත්සන් කළේ*

**රජීව් අමරසූරිය**
**සභාපති**
**ශ්‍රී ලංකා නීතිඥ සංගමය**

**නලින් ද සිල්වා**
**ලේකම්**
**ශ්‍රී ලංකා නීතිඥ සංගමය**




President
Rajeev Amarasuriya

Deputy President
Rienzie Arsecularatne PC

Secretary
Nalin De Silva

Treasurer
Pasindu Silva

Assistant Secretary
Lakitha Wakishta Arachchi

No. 153, Mihindu Mawatha, Colombo 12, Sri Lanka.
Telephone : +94 11 2447134, +94 11 2331697, Fax : +94 11 2331697 E-mail : info@basl.lk Web : www.basl.lk